අමා ගඟුල

කලාප අංක 214

ශ්‍රී බු. ව. 2568 ක්වූ බක් මස කලාපය, රා. ව. 2025 ක් වූ අප්‍රේල් මස 12 වන දින

දෙව්නුවර, කපුගම ශ්‍රී සුධම්මාරාමාධිපති

ශාස්ත්‍රපති පූජ්‍යපාද කපුගම ගරු සුගතසාර ස්වාමීන්ද්‍රයන් වහන්සේ විසිනි.

පිරිසිදු බව අපිම ඇති කර ගනිමු

නමො තසස භගවතො අරහතො සමමා සමබුදධසස !!!

අතතනා'ව කතං පාපං අතතනා සංකිලිසසති

අතතනා අකතං පාපං අතතනා' ව විසුජඣති

සුදධි අසුදධි පචචතතං නාඤඤමඤඤා විසොධයෙ.

"තමා විසින්ම පව්කරන ලද නම් තමාම කෙලෙසෙන්නේය. තමා විසින් පව් නොකරන ලද නම් එයින් තමාම පිරිසිදු වන්නේය.පිරිසිදු බව හෝ අපිරිසිදු බව තමාගේම කාර්යයකි. අනෙකෙකුගෙන් සිදු නොවන්නකි"

ගරු ස්වාමීන් වහන්ස, කාරුණික පින්වතුනි,

බුදුන් වහන්සේ දෙවන වර නාගදීපයට වැඩම කරවීම, කැලණියට වැඩමවනමෙන් මණි අක්බිත නා රජු බුදුන් වහන්සේට ආරාධනා කිරීම. මිණි පළඟ තැන්පත් කොට නාගදීප සෑය බැඳවීම, යන සිදුවීම් මෙම පොහොය දිනයේදී සිදුවී ඇත. මීට අමතරව බක් පෝය යෙදෙන්නේ අප්‍රේල් මාසයට නිසා ගස් වැල් මල් පලයෙන් බරව අපට භාග්‍යය උදාකරදෙන මාසය ලෙසද හැඳින්විය හැක.

මෙවන් උතුම් පොහොය දිනයක මෙම සඳහම් පණිවිඩයෙන් අපේක්ෂා කරන්නේ පිරිසිදු බව හා අපිරිසිදු බව පිළිබඳව විමසා බැලීමටය. මේ පිළිබඳව විවිධ ආගම් හා දර්ශන නොයෙක් මත පළකර තිබේ.මේ ලෝකය නිර්මාණය කරන ලද්දේ බලගතු දෙවියෙකුගේ නිර්මාණයක් ලෙසය. ඒ නිසා පිරිසිදු බව හා අපිරිසිදු බව ඒ දෙවියන්ගේ කාර්ය්‍යයකි. මෙම ඊශ්වර නිර්මාණ වාදය බුදු දහම අනුමත නොකරයි. තවත් පිරිසක් කියා සිටියේ පිරිසිදු බව හෝ අපිරිසිදු බව පෙර කරන ලද කර්ම වලට අනුව සිදුවන බවයි. එම පුබ්බේකත හේතුවාදය බැහැර කරන බුදුදහම කියා සිටින්නේ එම අදහසද වැරදි බවයි. තවත් සමහරු කියා සිටියේ පිරිසිදු බව හා අපිරිසිදු බව ඉබේට සිදුවන බවයි. අහේතු අප්පච්චය වාදය බැහැර කරන බුදු දහම එම අදහස ද ප්‍රතික්ෂේප කරයි. එම ආගමික මතවාද බැහැර කරන බුදු දහම කියා සිටින්නේ පිරිසිදු බව හා අපිරිසිදු බව තමා විසින්ම ඇතිකර ගන්නක් බවය. ඉහත කී අන්‍ය ආගමික මතවාද තුනම බුදුදහම ප්‍රතික්ෂේප කරන්නේ ඒවා පිළිගත හොත් පුද්ගලයා අකර්මන්‍ය වන නිසාය. බුදු දහම ඉහත කී ඉගැන්වීම් අකිරිය වාද ලෙස දක්වයි. කිරිය වාදයක් ලෙස හඳුන්වා දිය හැකි බුදු දහම කියන්නේ පිරිසිදු බව හෝ අපිරිසිදු බව තමා විසින්ම ඇති කර ගන්නක් බවයි.

ඉහත සඳහන් කළ ගාථාව සඳහන් වන්නේ ධම්මපදයේ අත්තවග්ගයේය. ධම්මපදට්ඨ කථාවේ මීට අදාළ නිදාන කථාව සඳහන් වේ. ඒ චුල්ල කාළ උපාසකතුමාගේ කථාවයි. සැවැත් නුවර චුල්ල කාළ නම් උපාසක තුමෙක් දැහැමින් ජීවත්වේ. එතුමා රාත්‍රියේ විහාරයට ගොස් බණ අසා උදේ ගෙදරට පැමිණෙයි. දිනක් රාත්‍රී සොරු ගෙයක් බිඳ ධනය රැගෙන පිටවී යත්ම ගෙහිමියෝ පිබිද සොරුන් පසුපස දුවන්නට වූහ. සොරු එම බඩු හැරදමා දුවන්නට වූහ. බඩු අයිතිකරුවෝ එනවිට මහමග දමා ගිය බඩු අසල චුල්ලකාළ සිටිනු දැක ඔහු සොරා යයි සිතා තැලීම් පෙළීම් ආදියෙන් කරදර කළහ. උදෑසන පැන්ගෙන යාමට පොකුණට පැමිණි දාසියෝ ඒ දැක "මේ උපාසක තුමා දැහැමියෙකි. කිසි වෙකුටවත් වරදක් නැති අයෙකි. යහපත් ගති ඇත්තෙකි". මෙසේ කියා කන්නලව් කොට ඔහු මුදවා ගත්හ. භික්ෂූන්ගෙන් මේ බව දැනගත් බුදුන් වහන්සේ දේශනා කළේ තමා විසින් පවක් කරන ලද නම් තමාම ඉන් කෙලෙසෙන බවත්, තමා විසින් පවක් නොකරන ලද නම් තමා ඉන් පිරිසිදු වන බවත්, පිරිසිදු බව හෝ අපිරිසිදු බව තමා පිළිබඳවම පවත්නා බවත්, එය අනිකෙකුට කළ හොහැක්කක් බවත්, දේශනා කළ සේක.

ලොව බිහිවූ හැම ආගමික නායකයෙකුගේම ඒකායන බලාපොරොත්තුව තම අනුගාමිකයින් වරදින් මුදවා ගෙන යහපතෙහි පිහිටුවීමයි. එම කාර්යය ශාස්තෘවරයාට කළ හැක්කක් නොවේ. තමා විසින්ම කරගත යුත්තකි"තුමෙහහි කිච්චං ආතපපං අකබාතාරෝ තථාගතා"මහණෙනි, ඔබලාම ඔබලාගේ කටයුතු කරගන්න තථාගතවරු මග කියා දෙන්නෝ පමණි. යනුවෙන් දේශනා කොට ඇත්තේද මෙයමය.

මෙම භාග්‍යවන්ත මාසය ගස්වැල් වල පරණ කොළ ඉවත් වී අලුත් කොළ ඇතිවී මලින් හා ගෙඩිවලින් සකස් වී ඇති බව කාටත් පෙනෙන දර්ශනයකි. මේ අනුව ලක්වැසි හැම දෙනාමත් පරණ කොළ නම් වූ අපිරිසිදු පරණ අදහස් ඉවතලා පිරිසිදු මල්වලින් හා ගෙඩිවලින් යුක්ත වීමට උත්සාහවත් විය යුතුයි. රට කරවන අය මේ දිනවල "ක්ලීන් ශ්‍රී ලංකා"යනුවෙන් වැඩපිළිවෙළක් දියත් කර තිබෙන්නේ අපේ රට පිරිසිදු කිරීම සඳහාය. නිදහස ලබා වසර හැත්තෑ හතක් ගත වෙලත් තාම අපි නියම පිරිසිදු කම ලබා නොමැත්තෙමු. මේ ගැන සිතා බලා කටයුතු කිරීමට අවශ්‍ය කාලය උදාවී ඇත.

පිරිසිදුකම ගැන කථා කරන බුදු දහම ක්‍රම දෙකකට එය විස්තර කර ඇත. අභ්‍යන්තර හා බාහිර වශයෙනි. මේ සඳහා යොදාගත හැකි හොඳම මූලාශ්‍රයක් හැටියට අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රය සඳහන් කළ හැකිය. රාහුල හිමියන්ගෙන් බුදුන්වහන්සේ අසන්නේ රාහුලය "කණ්ණාඩියෙන් කෙරෙන්නේ කුමක්ද? කියායි. එහිදී රාහුල හිමියන් පිළිතුරු දෙන්නේ "අඩුපාඩුකම් බැලීමටය" යනුවෙනි. බුදුන් වහන්සේ රාහුල හිමියන්ට පෙන්වා දෙන්නේ රාහුලය ශරීරයේ බාහිර අඩුපාඩුකම් බැලීමට කණ්ණාඩිය යොදාගත හැකි උවත් අභ්‍යන්තරයේ අඩුපාඩුකම් බැලිය නොහැකි බවයි.

අපේ බාහිර අඩුපාඩුකම් බලා සකස් කර ගැනීමට කණ්ණාඩිය උපකාර කර ගත හැකිය. එහිදී ඉතා පිරිසිදුවට තම ශරීරය පවත්වා ගත යුතු බවට උපදෙස් දී තිබේ. අපේ ශරීරය කොටස් තිස් දෙකකට බෙදා ඒවා කුණපකොටස් ලෙස දක්වා ඇතත් කේසාන්තයේ සිට පාදාන්තය දක්වා ඇති එම කොටස් පිරිසිදුව පවත්වා ගැනීම බාහිර පිරිසිදුකම ලෙස දැක්විය හැක. කෙස් වැටිය උදාහරණයට ගත හොත් බුදුන්වහන්සේ විශාඛාවට තම කේස කලාපය පිරිසිදු කර ගැනීමට දී ඇති

උපදේශය ඉතා වැදගත් වේ. එහිදී කෙස් පිරිසිදු කර ගැනීමට අවශ්‍ය දේ සඳහන් කර තිබේ. 1.කකකංච පටිච්ච - නෙල්ලි තම්බා සකස් කරගත් ටිකක්. 2.මතතිකංච පටිච්ච - මැටි දියකර පෙරා ගත් ටිකක්. 3. උදකංච පටිච්ච - වතුර ටිකක්. මේවා හිසට දමා තමාගේ උත්සාහයද ඊට අවශ්‍ය බව හතර වන කාරණය ලෙස දක්වා ඇත. 4. පුරිසසස තජජං වායාමං පටිච්ච. මෙවැනි කරුණු දේශනා කිරීමෙන් පැහැදිලි වන්නේ පුද්ගලයාගේ බාහිර පිරිසිදුකම ගැන මනා අවධානයක් තිබූ බවයි. උපසම්පදා භික්ෂූන් වහන්සේලාට අවවාද කරන තැන දිග නිය තබා නොගත යුතු බවට උපදෙස් දී තිබේ. කෙස්, ලොම්, නිය, දත්, ආදී දේ කුණප කොටස් උවත් ඒවායේ පිරිසිදුකම ගැන බුදු දහම අගේ කොට ඇත. ඇඳුම්, පැළඳුම්, ගෙවල්, දොරවල්, ඇතුළු බාහිර පරිසරයේ පිරිසිදුකම ගැනද බුදුදහම විස්තර කර ඇත. භික්ෂු විනයේදී ආරාමික පසු බිම තුළ ඒ පවිත්‍රතාවය තබා ගැනීම ගැන බොහෝ කරුණු දේශනා කොට ඇත. භික්ෂු භික්ෂුණී විනය තුළ සඳහන් වන වත් පිළිවෙත්ද මෙහිදී ඉතා වැදගත් වේ. බාහිර පිරිසිදුකම ගැන උගන්වන වත් පිළිවෙත්වල වත් දාහතරක් ගැන උගන්වයි. එහි අවසන් වතාවත ලෙස දැක්වෙන්නේ වැසිකිළි වතයි. බොහෝ දෙනා මේ ගැන වැඩි සැලකිලි නොදක්වන බව පෙනේ. නමුත් ඉතා පිරිසිදුවට පවත්වා ගත යුතු ස්ථානයක් ලෙස වැසිකිළිය දක්වා තිබේ. මේ බාහිර පිරිසිදු කමද තමන් සතු යුතුකමක් ලෙස හඳුනාගෙන ක්‍රියා කළ යුතුය.

පිරිසිදු කම ගැන කථා කරන විට බුදු දහම වැඩි අවධානයක් යොමුකරන්නේ අභ්‍යන්තර පිරිසිදු කම ගැනයි. මුලිනුත් සඳහන් කළ අම්බලට්ඨික රාහුලෝවාද සූත්‍රයේදී දේශනා කරන්නේ කණ්ණාඩියට නොපෙනෙන අඩුපාඩුකම් බලා ගැනීම සඳහා තම සිත දෙසට නැඹුරු විය යුතු බවයි. රාහුල හිමියන්ට දේශනා කළේ දෙවරක් සිතා බලා කයින් කර්ම කළ යුතුයි. පචචවෙක්ඛිත්වා පචචවෙක්ඛිත්වා කායෙන කමමං කාතබබං දෙවරක් සිතා බලා වචනයෙන් කර්ම කළ යුතුයි. පචචවෙක්ඛිත්වා පචචවෙක්ඛිත්වා වාචාය කමමං කාතබබං දෙවරක් සිතා බලා මනසින් කර්ම කළ යුතුයි. පචචවෙක්ඛිත්වා පචව වෙකඛිත්වා මනසාකමමං කාතබබං” මේ උපදේශයෙන් රාහුල හිමියන් දැනුවත් කළේ තිදොර මෙහෙයවන කටයුතු කරන විට ඉතා සැලකිලිමත් විය යුතු බවයි.

සතුන් මැරීම, සොරකම් කිරීම, කාමයන්හි වරදවා හැසිරීම කයින් සිදුවන වැරදි තුනයි. මේවා කරන අපිට දෙවරක් සිතා බලන්නටය කියා දේශනා කළේ අප

කරන ඒ හැම කායික ක්‍රියා වකටම අප ප්‍රතික්‍රියා දැක්විය යුතු නිසාය. අප ඉහත කී නරක ක්‍රියා කළහොත් එයින් අපේ කය අපිරිසිදු වන අතර ඒවාට අපට ලැබෙන ප්‍රතිඵල ද අමිහිරි අප්‍රසන්න ඒවා වෙයි. එසේ නම් අපේ කායික පිරිසිදු කම හෝ අපිරිසිදුකම අප විසින්ම ඇතිකරගන්නකි. එය වෙනත් බාහිර කෙනෙකුට කළ හැක්කක් නොවේ. බොරු කීම, කේලාම් කීම, පරුෂ වචන කීම, හිස් වචන කීම යන වාචසික ක්‍රියා කරන විට ඒවා ගැන දෙවරක් සිතිය යුතුයි.එසේ සිතිය යුත්තේ එම වැරදි වාචසික ක්‍රියා වලට ලැබෙන නරක ප්‍රතික්‍රියාවලට අප වගකිව යුතු නිසාය. ඒ නිසා අප වචනයෙන් පිරිසිදු හෝ අපිරිසිදු වන්නේ බාහිර බලවේගයක් නිසා නොව අපේම ක්‍රියා කාරකම් නිසා බව අබෝධ කර ගත යුතුයි.

ලෝභය, ක්‍රෝධය, මිත්‍යා දෘෂ්ටිය යන මේවා මනසින් සිදුවන වැරදිය. එවැනි දේ සිතට එන විටද අප ඒවා ගැන දෙවරක් සිතිය යුතුයි. අප එසේ සිතිය යුත්තේ එම වැරදි මානසික ක්‍රියාවලට ලැබෙන ප්‍රතික්‍රියාවලට අප වගකිව යුතු නිසාය. එසේ නම් මානසික පිරිසිදු බව හෝ අපිරිසිදු බවද අප විසින්ම කරගන්නකි. එය වෙනත් කෙනෙකුට කළ හැක්කක් නොවේ.

මෙසේ අප තිදොරින් කරන ක්‍රියා පිරිසිදු කරගත හොත් අපේ පිරිසිදුකම ඇතිවේ. ඒ පිරිසිදුකම අපට මේ සසර ගමන නතර කොට නිවන උදාකර ගැනීමට හේතුවෙයි.ගිහි පැවිදි අප හැම දෙනාම උත්සාහ විය යුත්තේ ඒ පිරිසිදු බව ළඟාකර ගැනීමටයි. බුදුන් වහන්සේට කළ හැක්කේ මෙම පිරිසිදු බව සඳහා යා යුතු මග පෙන්වා දීමය. ඒ මග අවංකව ගොස් අපේ ජීවිත පිරිසිදු කර ගැනීම අපට අයිති කාර්යයකි.

නූතන ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන "ක්ලීන් ශ්‍රී ලංකා " වැඩ සටහන ගැනද කිව හැක්කේ මෙවැනිම අදහස්මය. අපේ රටට නිදහස ලබා අවුරුදු හැත්තෑ හතක් ගතවන තුරුවත් අපිට පිරිසිදු වීමට බැරි වී තිබෙන්නේ අප එකිනෙකා වෙන් වෙන්ව පිරිසිදු වීමට කටයුතු නොකරන නිසයි. උදාහරණයක් හැටියට ගත හොත් රටේ පාලකයාට මේ පිරිසිදුකම තනියම කළ නොහැකිය. ඒ සඳහා සියලු රටවැසියාගේම උදව් උපකාර අවශ්‍යය. රට වැසියා හැටියට අපි හැමෝම මහන්සි වී අවංකව වැඩ කළ යුතුයි. නමුත් අපේ රටේ බොහෝ දෙනෙක් එසේ වැඩ නොකරන බව පෙනේ කාර්යාලයකට ගොස් වැඩක් කරගැනීමට අවශ්‍ය පුද්ගලයා එම කාර්යාලයට කීවරක් යා යුතුද? ඒ වැඩේ කර දිය යුතු නිලධාරියා හෝ නිලධාරිනිය මාසිකව ඒ සඳහා වේතනයක් ලබයි. ඒ ලබන වේතනයෙන් ඔහු තම අඹුදරුවන් පෝෂණය කරයි.එවැනි ජීවිත අපිරිසිදු ජීවිත හැටියට දැක්විය හැක. අපේ රටේ ජීවත්වන සමහරු යමෙක් තමාගේ කාර්යාලයට ආවොත් ඉතා

සුහද කථා බස් කොට ඔහුගේ අවශ්‍යතාවය ඉටුකර දෙති. එවැනි අයගේ ජීවිත පිරිසිදුය."ක්ලීන් ශ්‍රී ලංකා "තුළින් අප බලාපොරොත්තු වන්නේ එවැනි පිරිසිදු ශ්‍රී ලංකාවක් ගොඩ නැගීමය.

මෙහිදී වැඩි අවධානයක් යොමු කළ යුත්තේ බොහෝ අපිරිසිදු පුද්ගලයින් කරන සොරකම් පිළිබඳවයි. මේ දිනවල සතර වටින්ම ඇසෙන්නේ එවැනි මහා පරිමාණ සොරකම් පිළිබඳවයි. ඒ සොරකම් කරන අය කොතරම් සැඟවී ඒවා කළත් තම තමන්ගේ සිතට හොරෙන් ඒවා කළ නොහැකිය. ඕනෑම කෙනෙක් ව්‍යාපාරයක් කරන්නේ ලාභයක් ලබා ගැනීම සඳහායි. නමුත් එම ලාභය සාධාරණ එකක් විය යුතුයි. එසේ නූනොත් ඒ ලබන සියලු ලාභවලින් අපේ සිත දූෂිතවෙයි. එසේ ලාභ ලබමින් කටයුතු කළ බොහෝ දෙනා අද මානසිකව වධවේදනාවලට ලක්වෙමින් සිටින බව කාටත් පැහැදිලිය. රාජ්‍ය දේපල අවභාවිත කළ අය ඒ අපිරිසිදු ක්‍රියා නිසා තමාටත් රටටමත් කර ඇත්තේ මහ විපතකි. වැරදි සිදුවීම කෙලෙස් සහිත හැමෝගෙන්ම බොහෝ විට සිදුවන්නකි. ඒ නිසා ඒ වරද වරද හැටියට අවබෝධ කරගෙන මින්මතු එවැනි දේ නොකොට පිරිසිදු ක්‍රියා කරමින් කායික හා මානසික පිරිසිදු බව ඇතිකර ගැනීමට උත්සාහවත් විය යුතුයි. එය ප්‍රාර්ථනාවෙන් හෝ ආයාචනාවෙන් සිදුනොවේ. අපිම සිදුකර ගත යුත්තකි.

මෙම ධර්ම පත්‍රිකාව **www.sathyadahama.org**

අපගේ වෙබ් අඩවියෙන්ද කියවීමට පහසුකම් සලසා ඇති බව කරුණාවෙන් සලකන්න.